**අලයාඩිවේම්බු ප්‍රාදේශිය සභාව**
**අම්පාර දිස්ත්‍රික්කය**
**---------------------**

1. මූල්‍ය ප්‍රකාශන
------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2014 ජූලි 15 දින ද, ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2013 මැයි 03 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 24 දින සභාවේ, සභාපතිවරයා වෙත නිකුත් කරන ලදි.

1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට අලයාඩිවේම්බු ප්‍රාදේශිය සභාවේ මූල්‍ය තත්ත්වය එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
----------------------------------------

1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම
-----------------------------------------------------------

පළාත් පාලන පළාත් සභා අමාත්‍යාංශය ලේකම්ගේ 2014 ජනවාරි 27 දිනැති පීඑල්/05/පීජ්/එස්එෆ්පීඑස්ජ්එස් දරන චක්‍රලේඛය අනුව රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂන විය.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා ගෙවිය යුතු රු. 8,250 ක විගණන ගාස්තු සඳහා ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ආ) සභාවේ බැංකු ගිණුමට සෘජුව ලැබුනු රු. 232,185 ක මුදල හඳුනාගෙන ගිණුම් වලට ගෙන නොතිබුණි.

(ඇ) බැංකු විසින් සභාව වෙනුවෙන් සෘජුව ගෙවීම් කළ රු. 27,083 මුදල හඳුනාගෙන ගිණුම්වලට ගෙන නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ අයකර තිබූ මස්කඩ බදු වන රු. 698,400 මුදල ආදායම් ගිණුමට මාරු නොකර තැන්පත් ගිණුමේ රඳවා තිබුණි.

(ඉ) 2012 වර්ෂයෙදී පරිසර සංරක්ෂණය සම්බන්ධයෙන් මහජනතාවගෙන් අයකර තිබූ රු. 89,500 ක මුදල ආදායම් ගිණුමට මාරු නොකර තැන්පත් ගිණුමේ රඳවා තිබුණි.

1.3.3 ලැබිය යුතු ගිණුම්

මියගිය නිලධාරියෙකුගෙන් අයවියයුතු රු. 39,900 ක ණය ශේෂය නිලධාරියගේ මරණ පාරිතොෂිකයෙන් හෝ උරුමක්කාරයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ පහත දැක්වෙන අයිතමයන් ඉදිරියේ පෙන්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| අයිතමය | වටිනාකම<br>රු. | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|
| ඉඩම් හා ගොඩනැගිලි | 104,183,166 | ඉඩම් හා ගොඩනැගිලි ලේඛනය, ස්ථාවර වත්කම් ලේඛනය, වත්කම් පිළිබඳ විස්තරාත්මක උප ලේඛනය සහ සමීක්ෂණ මණ්ඩල වාර්තා |
| උපකරණ හා යන්ත්‍රෝපකරණ | 167,466 | |
| මොටර් වාහන හා කරත්ත | 1,871,290 | |
| කාර්යාලීය උපකරණ | 114,240 | |
| ලී බඩු හා සවිකිරීම | 139,525 | |
| පුස්තකාල පොත් | 1,390,525 | පුස්තකාල පොත් ලේඛනය |

1.3.5 නීති, රීති සහ රෙගුලාසි යනාදියට අනුකූල නොවීම්

පහත සඳහන් නීති, රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති සහ රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 12(1) සහ (2) වගන්ති සහ පළාත් පාලන, නිවාස ඉදි කිරීම් සහ ඉදි කිරීම් කර්මාන්ත අමාත්‍යාංශයේ 1988 ජනවාරි 13 වන දින අංක 488/16 දරණ ගැසට් පත්‍ර දැන්වීමේ 31(1) වන උප වගන්ති | ප්‍රාදේශිය සභාවේ කටයුතු ලිහිල් කිරීමේ අදහසින් අංගසම්පූර්ණ තීරණ ගැනීම සඳහා සහ උපදෙස් ලබා දීම සඳහා සභාවේ මුදල්, ප්‍රතිපත්ති සැලැසුම්, නිවාස ඉදිකිරීම්, සමාජ සංවර්ධන, තාක්ෂන සේවා, පාරිසරික සහ පොදු පහසුකම් යන කරුණු සඳහා කාරක සභා පත්කර නොතිබුණි. |
| (ආ) 1988 ප්‍රාදේශය සභා (මුල්‍ය හා පරිපාලන) රීති පරිච්ඡේදය X වගන්තිය 217-රිතිය | සභාව විසින් ප්‍රයෝජනයට ගනු ලබන සියළුම ඉඩම් සහ ගොඩනැගිලි සම්බන්ධයෙන් ලේඛනයක් පවත්වා නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය
-----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵලය
-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු. 3,523,627 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු. 957,526 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 2,566,150 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

2.2 ආදායම් පරිපාලනය
----------------------

2.2.1 වරිපනම් හා බදු
--------------

1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 134 වගන්තිය අනුව, ප්‍රාදේශිය සභාවේ බල ප්‍රදේශයතුල තිබෙන ඉඩම් සහ ඉදිකරන ලද නිවාස, ගොඩනැගිලි වලින් වරිපනම් බදු අයකර ගැනීම සඳහා සභාව විසින් කටයුතු කර නොතිබුණි.

2.2.2 වෙනත් ආදායම්
------------------

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 126 වන වගන්තිය අනුව සභාව විසින් අයකරීමට අදාල අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට කටයුතු කර නොතිබීම නිසා සභා බල ප්‍රාදේශයේ පෞද්ගලික ආයතනයන් තමන්ගේ වෙළඳ භාණ්ඩ ප්‍රචාරය කිරීම සඳහා ස්ථාපිත කරන ලද ප්‍රචාරක පුවරු 03 කින් අයවිය යුතු රු. 82,960 ක බලපත්‍ර ගාස්තුව සභාවට අහිමිවී තිබුණි.

(ආ) 1988 සිට 2012 වර්ෂය දක්වා හිඟව තිබූ මස්කඩ බදු රු. 546,318 ක මුදල සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා අයකර ගැනීමට කටයුතු නොකර දිගටම ගිණුම් ප්‍රකාශනවල පෙන්වා තිබුණි.

(ඇ) 2002 සිට 2012 වර්ෂය දක්වා හිඟව තිබූ රාජ්‍ය බදු ණය ගැතියන් රු. 31,480 ප්‍රමාණය සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අයකර ගැනිමට කටයුතු නොකර දිගටම ගිණුම් ප්‍රකාශන වල පෙන්වා තිබුණි.

(ඈ) 2010 මාර්තු 05 වන දින අංක 1644 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් නිවේදනය අනුව ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ 2009 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා ස්ථාපිත කරන ලද විදුලි සංදේශ කුළුණු 02 ක් සම්බන්ධයෙන් අයවියයුතු රු. 164,000 ක බලපත්‍ර ගාස්තු 2014 ජූලි 10 දින දක්වා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.3 උසාවි දඩ මුදල් සහ මුද්දර ගාස්තු

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ

(අ) උසාවි දඩ

-----------

විවිධ ආඥා පනත මගින් මහේස්ත්‍රාත් අධිකරණ වලින් 2013 දෙසැම්බර් 31 දිනට ලැබියයුතු රු. 2,220,803 ක මුදල නැගෙණහිර පළාත් සභාවේ ප්‍රධාන ලේකම් වරයාගෙන් ලබා ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

(ආ) මුද්දර ගාස්තු

---------------

2013 දෙසැම්බර් 31 දිනට ලැබියයුතු මුද්දර ගාස්තු වන රු. 1,971,148 ක මුදල රෙජිස්ටාර් ජනරාල් වරයාගෙන් ලබා ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2008 වර්ෂයේදී අයකර 2012 වර්ෂයේ අවසානය දක්වා තැන්පත් ගිණුමේ පෙන්වා තිබූ එකතු කළ අගය මත බදු, භාණ්ඩ හා සේවා බදු වල එකතුව රු. 433,811 ක් දේශිය ආදායම් කොමසාරිස් ජනරාල් වරයාට යැවීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2006 සහ 2007 වර්ෂවලදී අයකර තිබූ සේවක අර්ථසාධක අරමුදලේ දායක මුදල් වන රු. 167,454 ක මුදල සේවක අර්ථසාධක අරමුදලට යැවීම සඳහා කටයුතු කර නොතිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

---------------------------------------

4.1 අභ්‍යන්තර විගණනය

------------------------

එක් එක් පළාත් පාලන ආයතන තම තමන්ගේ හැකියාව අනුව අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා ගතයුතු බවට වූ පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ 2005 නොවැම්බර් 08 දිනැති අංක 03 දරන පළාත්පාලන ප්‍රතිසංස්කරණ චක්‍රලේඛයේ 8 වන වගන්තිය පරිදි සභාවේ අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා නොතිබුණි.

5. පද්ධති හා පාලන

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) කොන්ත්‍රාත් පාලනය

(ඇ) ස්ථාවර වත්කම් පාලනය

(ඈ) ආදායම් පරිපාලනය

(ඉ) ඇයවැය පාලනය